# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2422/17 - 2025 පෙබරවාරි මස 05 වැනි බදාදා - 2025.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා රෝගීන්ගේ සුරක්ෂිතතා හා ප්‍රතීතන (Accreditation) කාර්යාංශය සහ ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය සත්කාර සේවා ප්‍රතීතන කවුන්සිලය ස්ථාපිත කිරීම**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සත්කාර සේවා ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතා අධ්‍යක්ෂ ඒකකය (DHQS) 2012 සිට "මධ්‍යගතව පාලනය වන දේශීයව මඟපෙන්වන, සායනිකව දිශානුගත, රෝගීන් කේන්ද්‍ර කරගත් අඛණ්ඩ තත්ත්ව වැඩිදියුණු කිරීම" යන තේමාව යටතේ මෙරට සෞඛ්‍ය පද්ධතියේ සෞඛ්‍ය සත්කාර සේවාවන්හි ගුණාත්මකභාවය තහවුරු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික කේන්ද්‍රස්ථානය වේ.

2024 අගෝස්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව යමින්, පහත සඳහන් යෝජනාවන් ද්විත්වය ක්‍රියාත්මක කිරීමට, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනිමින් සිටී.

1. සෞඛ්‍ය සත්කාර සේවා ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ අධ්‍යක්ෂ ඒකකය (DHQS) පුළුල් කිරීම තුළින් සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා රෝගීන්ගේ සුරක්ෂිතතාවය සහ ප්‍රතීතන කාර්යාංශය ස්ථාපිත කිරීමට, එහි සංවිධාන සටහන ඇමුණුම - 1 හි සඳහන් වේ.

    ලිපිනය : WV5M+GM3, කාසල් වීදියේ කාන්තා රෝහල් පරිශ්‍රය, කොළඹ 08

    දුරකතන අංකය : 0112 678598

2. රෝගීන්ගේ සුරක්ෂිතතා හා ප්‍රතීතන කාර්යාංශයේ, උපදේශක සභාව ලෙස ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය සත්කාර සේවා ප්‍රතීතන කවුන්සිලය ස්ථාපිත කිරීමට. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය සත්කාර සේවා ප්‍රතීතන කවුන්සිලයේ සාමාජිකත්වය, ඇමුණුම - II ලෙස යා කොට ඇත.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 පෙබරවාරි මස 02 වැනි දින,
අංක 385, "සුවසිරිපාය"
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

1A - G 43670 — 05 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**Annexure 1**

## The Organization Structure of the Patient Safety and Accreditation Bureau



**Annexure II**

**Council Membership of the National Healthcare Accreditation Council**

1. Secretary of Health, Ministry of Health (Chair)
2. Director , Directorate of Healthcare Quality & Safety (Secretary)
3. Additional Secretary, Medical Services
4. Additional Secretary, Public Health Services
5. Director General of Health Services
6. Deputy Director General Medical Services 1
7. Deputy Director General Medical Services 11
8. Deputy Director General Planning
9. Deputy Director General Medical Supplies Division
10. Deputy Director General Education Training & Research
11. Deputy Director General Laboratory Services
12. Deputy Director General Non Communicable Diseases
13. Deputy Director General Dental Services
14. Presidents' of the professional colleges:
    a. Medicine
    b. Surgery
    c. Paediatric
    d. Obstetrics & Gynecology
    e. Anaesthesia
    f. Critical Care/ Emergency Medicine
    g. Medical Administration
    h. Community Medicine

15. President Sri Lanka Medical Association
16. Two selected Directors from the Teaching Hospitals
17. One Provincial Director of Health Services
18. One Regional Director of Health Services

EOG 02 - 0039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.